**බදුල්ල-චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2018**

**-------------------------------------------------------------------------**

බදුල්ල-චෙන්කලාඩි මාර්ගය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල සහ සවුදි සංවර්ධන අරමුදල අතර 2015 ජූනි 26 හා 2015 ඔක්තෝබර් 30 දින එළඹි අංක 1661 පී සහ 10/639 දරන ණය ගිවිසුම් යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය

**-----------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය සහ වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, පේරාදෙණිය බදුල්ල චෙන්කලාඩි මාර්ගයේ බදුල්ල සිට චෙන්කලාඩි දක්වා කි.මී. 147 ක මාර්ග කොටස පුනරුත්ථාපනය කිරීම මඟින් මධ්‍යම හා ඌව පළාත් සමඟ නැගෙනහිර පළාතේ සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම හා ප්‍රවාහනය වැඩිදියුණුකිරීම සහ එම පළාත්වල ආර්ථික කටයුතු ඉහළ නැංවීමයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,200 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 140 ක් වන අතර එයින් රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 60 ක් ඔපෙක් අරමුදල සඳහා වූ ජාත්‍යන්තර සංවර්ධන අරමුදල සහ රු.මිලියන 7,800 කට සමාන එ.ජ.ඩොලර් මිලියන 60 ක් සවුදි සංවර්ධන අරමුදල මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් ඉතිරි එ.ජ.ඩොලර් මිලියන 20 මූල්‍යායනය කිරීමට අපේක්ෂා කෙරේ. මෙම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 මාර්තු වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

**---------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට ඉඩම් මිලදී ගැනීම් වන්දි මුදල් නිරවුල් කිරීමේ දී ගෙවිය යුතු ප්‍රමාද පොලී රු.මිලියන 29.80 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වත්කම් හා බැරකම් අඩුවෙන් දැක්වීම. | 2019 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල මෙම කරුණ නිවැරදි කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08ට අනුකූලව ප්‍රතිපාදන සැලසිය යුතු වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| සංරචකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණන අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| මාර්ග පුනරුත්ථාපනය | වැඩ ආරම්භ වී වර්ෂ 03 ක් ඉක්ම ගොස් තිබුණද බදුල්ල සිට බිබිල දක්වා මාර්ග පුනරුත්ථාපන කටයුතුවල භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දින වන විට සියයට 21 සිට සියයට 46 ක් දක්වා පරාසයක පැවතුණි. | ඉදිකිරීම් කටයුතු නිම කිරීමේ ප්‍රමාදයන් නිසා පිරිවැය ඉහළ යාමේ අවදානමක් පවතී. | අනුමත කාල සීමාව අනුව ව්‍යාපෘති නිම කිරීමේ කාලය දීර්ඝ කළ හැකිය | අපේක්ෂිත කාලය තුළ ඉලක්ක සපුරා ගනිමින් පිරිවැය ඉහළ යාම් සහ කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් වළක්වා ගැනීමට කොන්ත්‍රාත්කරුවන් උනන්දු කළ යුතු වේ. |

**3.2 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණනයේ නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | ව්‍යාපෘති උපදේශකවරයා ලුණුගල සිට බිබිල දක්වා මාර්ග පුනරුත්ථාපන කටයුතුවල නිරතව සිටින කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය පිළිබඳව නිරන්තරයෙන් විවේචනය කර තිබුණද, කොන්ත්‍රාත් ගිවිසුමේ පොදු කොන්දේසි 15.2 වගන්තිය ප්‍රකාරව මේ සඳහා කිසිදු පිළියමක් යොදා නොතිබුණි. | ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඉහළ යා හැකි අතර ව්‍යාපෘතිය නිම කිරීමේ අනවශ්‍ය ප්‍රමාදයන් ඇති විය හැකිය. | මූලික පියවරක් ලෙස OFID පැකේජ 03 හි කොන්ත්‍රාත්කරුට “නිදොස් කිරීම දැනුම් දීම” උපදේශකවරයා විසින් නිකුත් කර ඇති අතර, ඉන් අනතුරුව ගිවිසුමේ පොදු කොන්දේසි 15.1 වගන්තිය ප්‍රකාරව අවසන් කිරීමේ ක්‍රියාවලිය යටතේ අමාත්‍යාංශ නිලධාරීන්, උපදේශකවරයා, කොන්ත්‍රාත්කරු සහ සේව්‍යයා විසින් කොන්ත්‍රාත් කාර්යයේ තත්ත්වය සමාලෝචනයට ලක් කරන ලදී. | කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට හෝ කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ii) | උපයෝගීතා සේවාවන් වන විදුලි බලය හා ජල සම්බන්ධතාව සැපයීම ආදිය විතැන් කිරීමේ කාර්යයන් වෙනුවෙන් රු.මිලියන 368 ක් එකවර ගෙවීම් කර තිබුණද ඒවා කාලෝචිතව ඉටු කර ගෙන නොතිබුණි. | අනවශ්‍ය ලෙස පිරිවැය හා කාලය ගත විය හැකි අතර ව්‍යාපෘතියේ මුළු පිරිවැය ද ඉහළ යා හැකිය. | උපයෝගීතා සේවාවන් කඩිනමින් විතැන් කිරීම සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රථමයෙන් උපයෝගීතා නියෝජිතායතන වෙත ගෙවීම් සිදු කර තිබුණි. | කාලෝචිතව වැඩ අවසන් කරගැනීම සඳහා අදාළ පාර්ශවයන්ගෙන් විධිමත් කාල සැලැස්මක් (Time Plan) ලබාගත යුතු වේ. |
| (iii) | කොන්ත්‍රාත්කරුවන්ට අදාළ කොන්ත්‍රාත්කරුගේ වියදමින් කාර්ය සාධන ආරක්ෂණ බැඳුම්කර ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ 4.2 වන උප වගන්තිය යටතේ කර ඇති විධිවිධානවලට පටහැනිව, මාර්ග පුනරුත්ථාපන කටයුතු සඳහා | කොන්ත්‍රාත්කරුවන්ට අනිසි ලෙස වාසිදායක විය හැක. | ගිවිසුමේ කාර්යසාධන බැඳුම්කර සඳහා වූ පොදු කොන්දේසි යටතේ වන (4.2) වගන්තිය අනුව, කොන්ත්‍රාත්කරු විසින් කාර්ය සාධන සුරක්ෂිතතාවයක් (ඔහුගේ වියදමින්) ලබා ගත යුතු අතර, එය කොන්ත්‍රාත් ගිවිසුමට ඇතුළත් වන අතර, | වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| | වන ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයන් කර ඇත්තේ කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන බැඳුම්කර ලබා දීමේ පිරිවැය උපුටා දැක්වීමට ඉඩ සලසමිනි. මේ අනුව, කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලැබී තිබූ කාර්යසාධන බැඳුම්කරය ප්‍රතිපූර්ණය කර ගැනීම සඳහා මීට අමතරව, රු.මිලියන 80 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | | එම කොන්ත්‍රාත් ගිවිසුමම BOQ වලින් සමන්විත වී, ඉහත අයිතමයන් වෙන වෙනම මිල නියම කිරීමට කොන්ත්‍රාත්කරු ගෙන් ඉල්ලීම් කර තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව වූ කොන්ත්‍රාත් ලියකියවිලි අතර ප්‍රමුඛතා ලියකියවිලි තිබිය යුතු අතර, අයිතමය ලබා ගැනීමට කොන්ත්‍රාත්කරුට ඇති හිමිකම ද, කොන්ත්‍රාත්කරුට සේව්‍යයා විසින් එසේ කිරීමට ඉල්ලා සිටින විට, BOQ විධිවිධාන යටතේ, ගිවිසුමේ පොදු කොන්දේසි 4.2 අනුව ලබා දී ඇති සාමාන්‍ය ප්‍රකාශ අවලංගු කරනු ලැබේ. | |
| (iv) | ගිවිසුමේ නිශ්චිත කොන්දේසිවල 14.6 උප වගන්තිය අනුව, අතුරු ගෙවීම් සහතිකය කළ වැඩවල සහතික කළ වටිනාකමින් පිළිගත් කොන්ත්‍රාත් මුදලින් සියයට 2 කට වඩා වැඩි විය යුතුය. එයට පටහැනිව, අවස්ථා පහකදී රු. මිලියන 35 සිට රු. මිලියන 52 ක් දක්වා වූ පරාසයකින් අතුරු ගෙවීම් සහතික මත ගෙවීම් සිදු කර තිබුණි. | අතුරු ගෙවීම් සහතික තක්සේරු කිරීමේදී පිරිවැය ඉක්මවා යාම. | වැඩවල ප්‍රගතියේ අනුපාතය සහ ඉංජිනේරුවරුන්ගේ නිර්දේශ කිරීම ඇතුලත්ව විවිධ සාධක දෙස බැලීමේදී, අවම වශයෙන් අතුරු ගෙවීම් සහතිකය යටතට ගැනෙන කොන්දේසි ලිහිල් කර ඇත.<br><br>අතුරු ගෙවීම් සහතිකයේ ගෙවීම් වටිනාකම පිළිබඳ නොසලකා කොන්ත්‍රාත්කරු මාසික අතුරු ගෙවීම් සහතිකය ඉංජිනේරුවරයාට ඉදිරිපත් කරන අතර පසුව ඉංජිනේරුවරයා එය අවම ගෙවීම් ප්‍රමාණය දක්වා අතුරු ගෙවීම් සහතික සමුච්චිත කිරීම සිදු කොට සේවා යෝජකයා වෙත යවනු ලැබේ. | පිරිවැය අවම කිරීම, කාලය සහ කොන්ත්‍රාත්කරුවන් වෙත අනිසි අනුග්‍රහය දැක්වීම සිදු නොකොට කොන්ත්‍රාත්තුවේ කොන්දේසියෙහි සඳහන් සීමාවන් පිළිපැදීම අවශ්‍ය වේ. |
| (v) | ලැබී තිබූ තොරතුරුවලට අනුව, මාර්ග පුනරුත්ථාපන කාර්යයන් වෙනුවෙන් රජයේ බිම් කැබලි 2,322ක් ඇතුළුව බිම් කැබලි 5,612ක් | හිමිකම් නිරවුල් කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් වන්දි මුදල්වල පොලී පිරිවැය ඉහළ යාමට හැකිය. | 2012 ජූනි සිට 2016 මාර්තු දක්වා අවස්ථා 20කදී වෙන වෙනම වගන්ති ගැසට් නිවේදන 38(අ) නිකුත් කර ඇත. එසේම වන්දි ගෙවීම | වන්දි නිරවුල් කිරීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර |

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය මගින් මිලදී ගැනීමට අපේක්ෂා කර තිබූ අතර 2018 දෙසැම්බර් 31 දින වන විට බිම් කැබලි 231ක් සඳහා රු. මිලියන 135ක වන්දි මුදල් නිරවුල් කර තිබුණි. | 2017 වර්ෂයේ සිට ආරම්භ කර ඇත. | එමගින් අමතර පිරිවැයන් ඇතිවීම වැලැක්වේ. |